# සිවිල් ගුවන් සේවා අමාත්‍යංශය

## සිවිල් ගුවන් සේවා අධිකාරිය

196 ගුවන් සංතරණ රෙගුලාසි යටතේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කෙරෙන දැනුම් දීම.

මගීන්, නැව් භාණ්ඩ හා තැපැල් ප්‍රවාහනය සඳහා කුලී මෙහෙයුම් සහ විධිමත් ප්‍රවාහන සේවාවක් (International - Charter Operation / Regular Operation) රට තුළ පවත්වාගෙන යාම සඳහා සිවිල් ගුවන් සේවා පනත (Act No. 14 of 2010) හා ඊට අදාළ රෙගුලාසි හා කොන්දේසි වලට අනුකූලව ගුවන් මෙහෙයුම් සහතිකය සහ බලපත්‍රය ලබා ගැනීම සඳහා කදාන, හල්පෙ මාවත, අංක 33/1 හි පිහිටි ස්පාර්ක් එයාර් (SPARK AIR) විසින් 2020 සැප්තැම්බර් මස 08 දාතමින් ඉල්ලුම් පත්‍රයක් 2020 සැප්තැම්බර් මස 09 වන දින මෙම කාර්යාලය වෙත එවනු ලැබ ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. ව්‍යාපාරික නාමය ලෙස ස්පාර්ක් එයාර් (පුද්ගලික) ආයතනය නමින් හඳුන්වන ආයතනය වෙළඳ නාමය වශයෙන් ස්පාර්ක් එයාර් (පුද්ගලික) ආයතනය යන නම භාවිත කරයි. අයදුම්පතට අනුව ස්පාර්ක් එයාර් (පුද්ගලික) ආයතනයේ (SPARK AIR (PRIVATE) LIMITED) අධ්‍යක්ෂ මණ්ඩලය මෙසේය.

කපිතාන් රොබට් එල්. ස්පිට්ල්
කපිතාන් මොහොමඩ් රම්සි රහීම්
කපිතාන් සමීන් අත්තනායක
කපිතාන් අශාන් ද අල්විස්
සුරන්ජන් ද සිල්වා මහතා

ස්පාර්ක් එයාර් (පුද්ගලික) ආයතනයේ (SPARK AIR (PRIVATE) LIMITED) එකී සමාගමේ යෝජිත ගුවන් මෙහෙයුම් කටයුතු පිළිබඳ පූර්ණ වගකීම සහ කළමණාකාරීත්වය සඳහා කපිතාන් මොහොමඩ් රම්සි රහීම් මහතා නම් කරනු ලැබ ඇත.

අයදුම්කරුගේ සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ පිටපතක් නො. 152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක, සිවිල් ගුවන් සේවා අධිකාරියේ 4 වන මහලෙහි පිහිටි තාක්ෂණික පුස්තකාලයේ තබා ඇති අතර ඕනෑම වැඩකරන දිනෙක කාර්යාල වේලාවන් තුල මහජනතාවට පරික්ෂාකර බැලීමට හැකිය.

යෝජිත මෙහෙයුම් සඳහා අවශ්‍යය ගුවන් මෙහෙයුම් සහතිකය (Air Operator Certificate ) ඇතුලු අනෙකුත් අදාල අනුමැතීන් ප්‍රදානය කිරීමට ප්‍රථම, සිවිල් ගුවන් සේවා පණත ගුවන් සංතරණ රෙගුලාසි මෙන්ම සහ මෙම ආයතනය විසින් පිලිගත් ඒ හා සම්බන්ධිත දේශීය අවශ්‍යතාවයන්ට අනුව නිරුපද්‍රිත වුත් ආරක්ෂිත වුත් කාර්යක්ෂම වූත් ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම් පැවැත්වීම සඳහා අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය සංස්ථාපිත ක්‍රියාමාර්ගානුකූලව නිසි පරිදි පරීක්ෂාකර බලා මෙම අයදුම්පත සහතික කිරීමේ වැඩ පිළිවල 2020 ඔක්තෝම්බර් මස 20 වන දිනට පසුව මවිසින් ආරම්භ කිරීමට තීරණය කර ඇති බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

<u>ඉහත පරිච්ඡේදයේ සඳහන් දිනට දින 10 කට ප්‍රථම ඕනෑම පුද්ගලයෙකු හට ඉහත කී අයදුම්පත සම්බන්ධව ලිඛිතව ,නිශ්චිත හේතු පදනම් කර ගත් කරුණු, ගගන නාවික සංතරණ රෙගුලාසි වලට අනුකූලව මා වෙත සංදේශනය කල හැකිය. අන්තර්ගත සියලු ප්‍රකාශන වල නිරවද්‍යතාවය ලිඛිත සාක්ෂි සමග ඉදිරිපත් කල යුතුය.</u> එවැනි සංදේශන මා වෙත ඉදිරිපත් කරන අවස්ථාවේදී ඔහු/ඇය විසින් එහි පිටපතක් අයදුම්කරුට ලැබීමට සැලැස්විය යුතු අතර, එසේ යැවූ බවට සහතිකයක් අදාල සංදේශයට අමුණා තිබිය යුතුය.

කපිතාන් තේමිය අබේවික්‍රම
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ
ප්‍රධාන විධායක නිලධාරී

2020 සැප්තැම්බර් මස 10 වෙනි දින
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය
අංක 152/1
මිනුවන්ගොඩ පාර
කටුනායක.